# කැළෑවේ රජ වූ පුංචි ලේනා



වෙනුලි අත්නතනායක

# කැළෑවේ රජ වූ පුංචි ලේනා

කතෘ :- වෙනුලි අත්තනායක

පළමු දිගහැරුම

මහමායා බාලිකා විද්‍යාලය

**7-B**

# පිදුම

මා

ආදරණීය ගුරු මෑණිවරුන්ට

හා

ගුරු පියවරුන්ට

මේ පොත

පුදමි...!

(2)



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

CS CamScanner

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

<u>සුභාශිංසන පණිවුඩය</u>

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# පටුන

1. අලුත් රජෙක් තේරීම.
2. සතුන් අතර සටනක්.
3. පුංචි ලේනා.
4. ස්වභාවික විපත.
5. ටික්කුගේ සැළසුම.
6. ටික්කෙුග් නුවණ.
7. අරුම පුදුම දිය උල්පත
8. ජීවිත බේරා ගැනීම
9. නිල්වණ අරණේ රජතුමා

- පසුවදනය

# අලුත් රජෙක් තේරීම.

ඈත අතීතයේ සදාහරිත තුරුලතාවලින් සහ සිසිල් දිය දහරාවලින් පිරී ඉතිරී ගිය ඉතාමත් මනරම් වනාන්තරයක් තිබුනා.එහි නම "නිල්වන අරණ"යි.නිල්වන අරණේ විවිධ වර්ගයේ සතුන් දහස් ගණනක් කිසිඳු සැකයකින් තොරව ජීවත් වුණා.මෙම මහා වනාන්තරය පාලනය කළේ "වික්‍රම"නම් මහළු නමුත් සාධාරණ සිංහ රජෙක්.

සිංහ රජු වයස්ගත වීම නිසා දිනක් වන සපුන් දැඩි සෝකයක ගිල්වමින් අවසන් හුස්ම හෙළුවා. රජුගේ මරණයත් සමඟ මුළු වනන්තරයම දැඩි අනාථ භාවයකට පත් වුණා. සැබෑ ප්‍රශ්නය පැන නැගුණේ ඉන් පසුවයි. වනාන්තරයට ඊළඟට අලුත් රජෙකු තෝරා ගන්නේ කෙසේදයන්න කාටත් ලොකු ප්‍රහේලිකාවක් වුණා.



## • සතුන් අතර සටනක්.

නිල්වන අරණේ සිටි ශක්තිවන්ත සහ විශාලම සතුන් වූ “භෛරව” නම් දරුණු කොටියා, “භූමා” නම් බියකරු වළහා සහ “චණ්ඩ” නම් මහා අං තට්ටුවක් සහිත වල් මී හරකා තමන් කෙසේ හෝ රජ විය යුතු යැයි තීරණය කළා.ඔවුන් තිදෙනා කැළෑවේ බලය ඇල්ලීම සඳහා තමන්ට පක්ෂපාතී සතුන් එකතු කරගෙන රහසිගත කණ්ඩායම් සාදා ගත්තා.සතුන් එකිනෙකා කෙරෙහි සැක කරන්නට වූ අතර,වනාන්තරයේ

තිබූ සාමකාමී වටපිටාව ක්‍රම ක්‍රමයෙන් නැති වී ගියා.බලලෝභී සතුන් තිදෙනා නිතරම මහා සටන් ඇති කරගත් අතර,එයින් නිරපරාදේ පීඩා වින්දේ කැළෑවේ සිටි අහිංසක,කුඩා සතුන්ය. ඔවුන් නිතරම කෑගසමින් කියා සිටියේ තමන්ගේ  දත් සහ නියපොතු මෙන්ම ශරීරයේ ප්‍රමාණය නිසා තමන් පාලකයා වීමට සුදුසු බවයි.



## •<u>පුංචි ලේනා</u>.

මේ අතර, වනාන්තරයේ මැද පිහිටි විශාල කල්ප වෘක්ෂයක "ටික්කු" නමින් කුඩා ලේනෙකු ජීවත් වුණා. ටික්කු යනු ඉතාමත් කඩිසර,කරුණාවන්ත, අසාමාන්‍ය ලෙස බුද්ධිමත් ලේනෙක්.



ඔහු සැමවිටම කැලෑවේ සතුන් සමඟියෙන් සහ සතුටින් සිටිනු දැකීමට ආශා කළා. නායකයන්ගේ රණ්ඩු සරුවල් සහ තණ්හා අධික බව නිසා මුළු වනාන්තරයම විනාශයට පත්වන ආකාරය ටික්කු දුටුවේ දැඩි කණගාටුවකිනි. ඔහු නිතරම තමන්ගේ කුඩා මිතුරන් වූ හාවුන් සහ කුරුල්ලන් සමඟ පැවසුවේ බලයෙන් පමණක් රටක් හෝ කැළෑවක් පාලනය කළ නොහැකි බවයි.කාලය කෙමෙන් කෙමෙන්

ගෙවී යද්දී නිල්වන අරණට පෙර නොවූ විරූ මහා ස්වභාවික විපතක් උදා වුණා.මාස අටක් තිස්සේ එයට වැහි පොදක්වත් වැටුණේ නැහැ. ගස්වල කොළ කහ පැහැ වී බිමට හැලෙන්නට වුණා.සතුන්ගේ එකම ජීවනාලිය වූ "නීල ගංගාව" සහ විශාල වැව් සියල්ලම සිඳී,පස් තට්ටු ඉරිතලා වෙළී ගියා. සතුන් දැඩි ලෙස පිපාසයෙන් සහ බඩගින්නෙන් පීඩා වින්දා.



## •ස්වභාවික විපත

රජකමට පොරකෑ කොටියා, වළහා සහ මීහරකා මේ මහා විපත හමුවේ සම්පූර්ණයෙන්ම අසරණ වුණා.ඔවුන්ට ප්‍රශ්නයට විසඳුමක් සෙවීමට තරම් බුද්ධියක් හෝ දැක්මක් තිබුණේ නැහැ.ඔවුන් කළේ තමන්ගේ පිපාසය නිවා ගැනීමට පොඩි සතුන් ඉතා අමාරුවෙන් සඟවාගෙන සිටි දිය බිඳ බිඳ පවා බලහත්කාරයෙන් උදුරා ගැනීමයි. කැළෑවේ පුරා මරණයේ සෙවණැලි වැටෙන්නට වූ අතර සතුන් බලාපොරොත්තු

සුන් කරගෙන මියයන දිනය දෙස බලා සිටියා.වනාන්තරයේ මහළු සතුන් පැවසුවේ මෙවැනි නියඟයක් ඔවුන්ගේ ජීවිත කාලයටම දැක නොමැති බවයි.



## • ටික්කුගේ සැළසුම.

ටික්කු ලේනා මේ විපත දෙස බලා නිශ්ශබ්දව සිටියේ නැහැ. ඔහු සිතුවේ ශාරීරික ශක්තියට වඩා බුද්ධියෙන් සහ සාමූහික එකතුවෙන් මේ ප්‍රශ්නය ජය ගත හැකි බවයි. ඔහු වහාම වනාන්තරයේ සිටි කුඩා සතුන් වූ හාවුන්,ඉත්තෑවුන්,මීයන් සහ කුරුල්ලන් සියල්ලම රහසින් කල්ප වෘක්ෂය අසලට රැස්කලා. "අපිහැමෝම එකතු වුනොත්,අපේ කුඩා ශක්තිත් එකතු කළොත් මේ ප්‍රශ්නයෙන් බේරෙන්න පුළුවන්.

කරුණාකරලා මට උදවු කරන්න.”ටික්කු ඉතාමත් ආදරයෙන් ඔවුන්ගෙන් ඉල්ලා සිටියා.කුඩා සතුන් හැම දෙනාම ඔහු කෙරෙහි විශ්වාසය තබා ගත්තා.



## ●ටික්කුගේ නුවණ.

ටික්කු තමාගේ කඩිසරකම භාවිත කරමින්, කැළෑවේ සෑම තැනකම ඇවිදිමින් ජලය සෙවීම මහා මෙහෙවුමක් ආරම්භ කළා.ඔහු උස් ගස් මුදුන්වලට නැඟ මුළු පරිසරයම නිරීක්ෂණය කළා. දිනක් වනාන්තරයේ ඈත කෙළවරක පිහිටි “කළු පර්වතය” අසල වසා තිබුකුඩා පක්ෂින් පිරිසක් ටික්කුගෙ නෙත ගැටුණා. පොළොව වියළී තිබුණත්,ඒ අසල තිබූ එක්තරා පඳුරක්

පමණක් තද කොළ පැහැයෙන් තිබෙනු ටික්කු දුටුවා.



ටික්කු වහාම ගසෙන් ගසට පැන එතැනට ගොස් බිම පරීක්ෂා කළා. ඔහුගේ තියුණු

ඉවට පොළොව යටින් සියුම් සිසිල් තෙතමනයක් දැනුණා.

## • අරුම පුදුම දිය උල්පත

පොළොව යට විශාල දිය උල්පතක් ඇති බව ටික්කූ වටහා ගත්තා.නමුත් එය තිබුනේ විශාල ගල් පර්වත සහ පස් තට්ටුවලට යට වීය.ටික්කූ වහාම කුඩා සතුන් පස් කනින්නට විය. ඉත්තෑවන් හා මීයන් තමන්ගේ තියුණු නියපොතුවලින් පස් ඉවත් කළා. කුරුල්ලෝ වියළි කොළ සහ

අතු,රොඩු අහකට ඇද දැමුවා. නමුත් විශාල ගල් ඉවත් කිරීම ඔවුන්ටතනිවම කළ නොහැකි තරම් බර වැඩක් වුනා. කුඩා සතුන් මහන්සියෙන් හතිලන්නට වුනා.



## •ජීවිත බේරා ගැනීම.

ටික්කු බිය නොවී, බලලෝභී නායකයන්ගෙන් බැටකා අසරණ වී සිටි අලි ඇතුන් සහ අනෙකුත් මී හරකුන් වෙත ගියා. ඔහු ඉතා ගෞරවයෙන් සහ බුද්ධිමත්ව ඔවුන්ට කතා කර තත්වය පැහැදිලි කළා. ටික්කුගේ සැලසුම සහ අවංකභාවය දුටු අලි ඇතුන් වහාම උදවු කිරීමට ඉදිරිපත් වුණා. අලි ඇතුන් තමාගේ මහා හොඬවල් සහ ශක්තිය යොදා ගල් පර්වත පෙරළා දැමුවා.

පුදුමයකි! ඒ යටින් සිසිල් පිරිසිදු දිය දහරාවක් මුළු පරිසරයම සිසිල් වී ගලා එන්නට වුණා. සතුන් සතුටින් කෑ ගසමින් පිපාසය නිවාගත්තා. ටික්කුගේ බුද්ධිය නිසා මුළු පරිසරයම මරණයෙන් බේරුණා.

## •<u>නිල්වණ අරණේ රජතුමා</u>

පසුදින නිල්වණ අරණේ ඉතිහාසයේ විශාලත සත්ව මහා සභාව කැඳවනු ලැබුවා. කැලෑවේ සිටි කුඩා ලොකු සියලූම සතුන් එකම පිට්ටනියකට රැස්ව සිටියා.

එහිදී කොටියා, වලසා, මීහරකා සියලු දෙනා ඉදිරියට පැමිණ, ටික්කු ලේනා ඉදිරියේ දණ නමා තමාගේ වැරදිවලට සමාව ඇයද සිටියා. "මේ කැලෑවේ රජකමට සුදුසු එකම සතා අපව බේරාගත් බුද්ධිමත් ටික්කු පමණයි." ඔවුහු ඒකමතිකව ප්‍රකාශ කළා. සියලූම සතුන් එම අදහස පිලිගනිමින් කෑ ගසන්නට වුණා.

නිමි

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)